**දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදල - 2020**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 20 දිනැති අංක අමප/19/0838/ 101/059 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | (i) අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.1(ii) හා (iii) ඡේද ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළ "කැපකරු මාපිය - දූදරු" වැඩසටහන යටතේ ලියාපදිංචි වී ආධාර සලසන පරිත්‍යාගශීලීන්ගෙන් හා විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් අරමුදල සඳහා පරිත්‍යාග/ ආධාර ලබා ගැනීමට අරමුදල කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම අරමුදල පිහිටුවා ඉතා කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් විෂය පථයන් සංශෝධනය කරමින් 2019 දෙසැම්බර් 10 දින නිකුත් කරන ලද අංක 2153/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති කාර්යාලය යටතේ පැවති දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතට පත් කර තිබුණි. එබැවින් සැලසුම් කළ ආකාරයට අරමුදලේ කටයුතු ක්‍රියාත්මක නොවුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| | | (ii) අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.4 ඡේදය ප්‍රකාරව, අරමුදලේ භාරකරුවන් විසින් අරමුදලේ කළමනාකරණය හා ආධාර ලබාදීම සඳහා ක්‍රමවේද, විධිවිධාන හෝ පරිපාටීන් 2020 දෙසැම්බර් 31 දින වන | -එම- | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | විටත් පිළියෙල කර නොතිබුණි. | | |
| | | (iii) අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.5 ඡේදය ප්‍රකාරව, 2020 වර්ෂයට අදාළව අරමුදලේ කාර්යසාධනය පිළිබඳ වාර්තා පිළියෙල කර, එම වාර්තා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. | -එම- | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| | | (iv) අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.6 ඡේදය ප්‍රකාරව, භාර අරමුදල කළමනාකරණය සඳහා අත්‍යාවශය කාර්ය මණ්ඩලය එහි භාරකරුවන් විසින් තීරණය කර බඳවා ගැනීම සහ කළමනාකරණය කිරීම කළ යුතු වුවද, එලෙස කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා භාර අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | -එම- | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | 2019 ඔක්තෝබර් 16 දිනැති අංක අමප/19/2849/ 101/059-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය | (i) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අසරණභාවයට පත් වූ දරුවන් හා විශේෂ දක්ෂතා ඇති දරුවන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ අනාගත සුරක්ෂිතතාවය වෙනුවෙන් ආධාර උපකාර අපේක්ෂාවෙන් නිරන්තරයෙන් ඉල්ලීම් ලැබෙන බැවින්, මෙම අරමුදල ක්‍රමවත් ලෙස වර්ධනය කරගත යුතුව තිබුණි. එබැවින්, පරිත්‍යාගශීලීන්ගෙන් පමණක් ලැබෙන ආධාර මුදල් පමණක් ප්‍රමාණවත් නොවූ බැවින්, ජාතික ලොතරැයි මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන, සතියකට වරක් දිනුම් අදින ලොතරැයි පතක් අලෙවි කර, ඒ මගින් ලැබෙන | -එම- | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අතිරික්තය “දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදල” වෙත බැර කර උක්ත භාර අරමුදල ශක්තිමත් කර, දැයේ දරුවන්ගේ යහපත සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝජනා කර තිබුණි. ඒ අනුව 2020 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා ජාතික ලොතරැයි මණ්ඩලයෙන් රු.9,307,308 ක් අරමුදල වෙත ලැබී තිබුණි. එසේ වුවද, එම මුදල් අරමුදලේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අරමුදල විසින් උපයෝජනය කර නොතිබුණි. | | |
| (ii) අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ලොතරැයි අලෙවියෙන් අරමුදලට කරනු ලබන ප්‍රේෂණයන් රජයේ බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරමින් එමගින් ලැබෙන පොලී ආදායම යොදාගෙන දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදලේ පරමාර්ථයන් සඳහා යෙදවිය යුතුව තිබුණද 2020 වර්ෂය තුළ ලැබුණු රු. 9,307,308 ක ආදායම එකී කාර්යය සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර නොතිබුණි. | -එම- | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 10,773,628 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.17,724,917 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,951,289 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය සඳහා පරිත්‍යාග නොලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) "දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදල" මගින් පහත සඳහන් අරමුණු ඉටු කළ යුතුව තිබුණි.<br><br>(i) විවිධ ප්‍රභවයන්ගෙන් හඳුනාගනු ලබන අතිශය දරිද්‍රතාවයෙන් යුත් පවුල්වල දරුවන් හට ආධාර කිරීම.<br><br>(ii) දෙමාපිය රැකවරණය හා සුරක්ෂිතභාවය අහිමි දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා පිහිට වීම.<br><br>(iii) නිවුන් දරුවන් හෝ ඊට වැඩි දරුවන් ප්‍රමාණයක් එක්වර බිහි කිරීම හේතුවෙන් ඔවුන් රැකබලා ගැනීමට ඇති ආර්ථික දුෂ්කරතාවයන්ට උපකාරී වීම.<br><br>(iv) දෙමාපියන් විසින් දරුවන් අතහැර දැමීම හේතුවෙන් අසරණභාවයට පත් දරුවන්ගේ සුභසාධනයට උපකාරී වීම.<br><br>(v) උපතින්ම හෝ වෙනත් හේතු මත ආර්ථික දුෂ්කරතාවයන්ගෙන් පෙළෙන දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ආධාර දීම.<br><br>(vi) විවිධ සුවිශේෂී දක්ෂතාවයන්ගෙන් හෙබි එහෙත් දරිද්‍රතාවය හේතුවෙන් ඉදිරියට යාමට හෝ එම දක්ෂතාවයන් ඔප් නංවා ගැනීමට අපහසුතා ඇති දරුවන් හට උපකාරී වීම.<br><br>(vii) නව නිපැයුම්, අත්හදා බැලීම්, පර්යේෂණ හා නව සොයා ගැනීම් සිදු කරනු ලබන සහ සුවිශේෂී ක්‍රීඩා කෞෂල්‍යයන් සහිත හා සුවිශේෂී අධ්‍යාපනික දක්ෂතා සහිත දරුවන් හට උපකාර කිරීම.<br><br>(viii) පරිත්‍යාගශීලීන් හට "කැපකරු මාපිය - දූදරු" වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | ඉහත සඳහන් පරිදි අරමුදල කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතට පත් කර තිබුණු බැවින් අක්‍රිය තත්ත්වයේ පැවතීම හේතුවෙන් මුදල් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝජනය කර ගැනීමට අවස්ථාවක් නොලැබීම නිසා ස්ථාවර තැන්පතුවල පැවති මුදල් ආපසු ගැනීමට අවශ්‍යතාවයක් මතු වී නැත. | අරමුදලේ මුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.28,498,545 ක් වූ අරමුදලේ ශේෂය, ඉහත කී අරමුණු සඳහා උපයෝජනය නොකර, බැංකු ජංගම ගිණුමේ රු.10,329,475 ක මුදලක් රඳවාගෙන තිබූ අතර, ස්ථාවර තැන්පතුවල රු.18,169,070 ක් ආයෝජනය කර තිබුණි. | | |
| (ආ) | 2020 ජූලි 16 දිනැති අංක අමප/20/1009/212/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2020 ජූලි මාසයේ සිට 2020 නොවැම්බර් මාසය දක්වා ලොතරැයි අලෙවියෙන් ලද රු.9,348,408 ක් ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණු අතර එම මුදල් ඉහත (අ) හි සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයෙන් තහවුරු කර ඇති පරිදි මෙම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති අතර, අරමුදලේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම. |
| (ඇ) | 2019 වර්ෂය තුළ අරමුදල වෙත ලැබී තිබුණු රු.17,522,167 ක පරිත්‍යාග මුදලින් රු.16,500,000 ක ස්ථාවර තැන්පතු ආරම්භ කර තිබුණි. එම ස්ථාවර තැන්පතු වලින් 2020 වර්ෂයට පමණක් අදාළව එකතුව රු.1,466,320 ක් වූ ආයෝජන පොළී ආදායමක් අරමුදල වෙත ලැබී තිබුණු නමුත් එම මුදල් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපයෝජනය කර නොතිබුණි. | ඉහත 3.1 හි පරිදි අරමුදල කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතට පත් කර තිබුණු බැවින් හා අරමුදල අක්‍රිය තත්ත්වයේ පැවතීම හේතුවෙන් මූල්‍ය වත්කම් අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝජනය කර ගැනීමට අවස්ථාවක් නොලැබුණි. | අරමුදලේ අරමුණු ඉටු වන අයුරින් ක්‍රියා කළ යුතු වීම |
| (ඈ) | 2020 ජූලි 08 දිනැති අංක අමප/20/1009/212/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදල වසා දමා එකී අරමුදලේ පවත්නා ශේෂය ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කර තිබුණි. එසේ වුවද, අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් එම කටයුත්ත සිදු කර නොතිබුණු අතර, මාස 20 ක් ප්‍රමාද වී, 2022 මාර්තු 14 දින ජනාධිපති කාර්යාලය විසින් අරමුදල වසා දමා එහි ශේෂය ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. | අරමුදලේ අවසන් ශේෂය ජනාධිපති අරමුදල වෙත ප්‍රේෂණය කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. |